**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව - 2010**

-------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

-----------------------------

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් නිරීක්ෂණයන් විය.

-------------------------------------------------------------------------------

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 18 ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණිත අගයන්ට ගිණුම් වල දක්වා ඇති විට හෙළිදරව් කල යුතු තොරතුරු ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. තවද වත්කම් ප්‍රත්‍යාගණන ලාභය වූ රු.1,629,300 ක් ප්‍රත්‍යාගණනය සංචිත යටතේ දැක්විය යුතු වුවත්, සමුච්චිත අරමුදල් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 3 ප්‍රකාරව ආදායම් හා වියදම් වෙනම වාර්තා කල යුතු වුවද, වැඩ මුළුවකින් ලද ආදායම් හා වියදම පිළිවෙලින් රු. 53,000 හා රු.59,660 මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම දක්වනවා වෙනුවට එහි ශුද්ධ ප්‍රතිඵලය වූ රු.6,660 තරුණ විද්‍යාර්ථීන්ගේ සංසදයේ මෙහෙයුම් කමිටු වියදම් ලෙස දක්වා තිබුණි.

### 1.2.2 නීති,රීති , රෙගුලාසි වලට අනුකූල නොවීම්

----------------------------------------

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛය | |
| 6.5.1 | කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| 6.5.3 | 2008 වර්ෂයට අදාල ගිණුම් හා විගණන වාර්තා 2011 මාර්තු 10 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| 9.3.1 | කොමිෂමේ බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කරවාගෙන නොතිබුණි. |
| 9.6 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම සඳහා කාර්ය සාධක ඇගයීමක් ක්‍රියාත්මක කර නොතිබුණි. |

### 1.2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

----------------------------------------------------------

සේවකයන්ට ලබා දෙන ආපදා ණය මුදලෙන් ආපසු අය කර ගන්නා වාරික මුදල් තැන්පත් කර රු.124,184 ක ආපදා ණය අරමුදලක් ආරම්භ කර තිබුණි. මෙම චක්‍රීය අරමුදල සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------------

2.1 **මූල්‍ය සමාලෝචනය**

---------------------

2.1.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය වූ රු.13,325,000 ගණන් ගැනීමෙන් පසු සභාවේ වැඩකටයුතු වලින් රු.771,615 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් වූ රු.12,790,000 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු රු.1,713,957 ක ඌනතාවයක් විය. ඒ අනුව පෙර වර්ෂය හා සසඳන කළ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,485,572 ක වැඩිවීමක් දක්නට ලැබුණි.

2.2 **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

2.2.1 **කාර්ය සාධනය**

-----------------

(අ) 2010 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්ම තුල ඇතුලත් කර ඇති පහත සඳහන් කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි.

| සැලැස්මේ විෂය අංකය | ඉලක්කය | කාර්යය |
|---|---|---|
| 01. | ප්‍රතිපත්ති සම්පාදනය කර වාර්තාවක් ඉදිරිපත් කිරීම. | දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම පමණක් සිදු කිරීම. |
| 02. | පසුගිය වර්ෂ 05 කට අදාල සමාලෝචිත වාර්තාවක් සකස් කිරීම. | 2006-2008 වර්ෂවලට අදාල සමාලෝචනය පමණක් සිදුකර තිබුණි. |
| 03. | ආයතන 03 ක ප්‍රගතිය සමාලෝචනය කිරීම. | ආයතන 02 ක පමණක් ප්‍රගතිය සමාලෝචනය කර තිබුණි. |

(ආ) ප්‍රතිපත්තිමය සම්බන්ධ කරුණු සහ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මුඛ්‍ය විධි නියෝගය සඳහා සහාය වීමේ මූලික පරමාර්ථයෙන් ක්‍රියාත්මක විය යුතු විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ නායකයින්ගෙන් සමන්විත ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින්ගේ සංසදයේ ක්‍රියාකාරීත්වය වාර්ෂික මහා සභා රැස්වීමට පමණක් සීමා වී තිබුණි.

### 2.2.2 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

පිරිවැය රු.40,000 ක් වූ ඇට්ලන්ටික් 24000 බීටීයු වර්ගයේ වායු සමීකරණ යන්ත්‍රයක් වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් තිස්සේ අක්‍රියව පැවතුණි.

### 2.2.3 **අනාර්ථික ගනුදෙනු**

--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

| ගනුදෙනුව | මුදල (රු) | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) කුලී වාහන | 34,783 | අවම ධාවනය කි.මී. 3000 ක් සඳහා රු. 39,200 කට කුලියට ගත් වාහනයෙන් සැප්තැම්බර් මාසය තුල ධාවනය කරන ලද මුළු දුර කි.මී.338ක් වූයෙන් , කුලී වාහනය වෙනුවෙන් ගෙවූ රු. 34,783 ක මුදල අනාර්ථික වියදමක් වී තිබුණි. |
| (ආ) හෝටල් ගාස්තු | 96,050 | හය වන ද්වි වාර්ෂික සමුළුවට සහභාගි නොවූ සාමාජිකයින් සඳහා කාමර වෙන් කිරීම හේතුවෙන් රු. 96,050 ක හොටල් ගාස්තු වැඩියෙන් ගෙවීමට සිදු වී තිබුණි. |
| (ඇ) භාෂා පරිවර්තක ගාස්තු | 12,754 | ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය දෙවරක් දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම වෙනුවෙන් අමතරව රු. 12,754ක් වැය කිරීමට සිදු වී තිබුණි. |

### 2.2.4 **සංයුක්ත සැලැස්ම**

--------------------

ආයතනය විසින් 2008-2012 වර්ෂ වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් එය වර්තමාන ප්‍රවණතාවයන් සැලකිල්ලට ගෙන යාවත්කාලීන කර නොතිබුණි. පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම තුල අන්තර්ගත කර තිබුණු ඉලක්කයන් සංඛ්‍යාත්මකව දක්වා නොතිබුණු බැවින් කාර්ය සාධනය ඇගයීමට ලක්කල නොහැකි විය.

### 2.2.5 අභ්‍යන්තර විගණනය

----------------------

අදාල රේඛීය අමාත්‍යාංශයේ සහාය ඇතිව හෝ අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

### 2.2.6 අයවැය ලේඛණමය පාලනය

-------------------------------

සමාලෝචිත වර්ෂය තුල අයවැයගත හා තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය වුණි.

## 3. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වර්න්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) කාර්ය සාධනය

(ආ) ගණකාධිකරණය

(ඇ) අභ්‍යන්තර විගණනය

(ඈ) වාහන උපයෝජනය

(ඉ) අයවැය පාලනය